(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 43.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0305/'10

1.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිධුරය යම් පුද්ගලයෙකුට හෙබවිය හැකි වාර ගණන කොපමණද;

(ii) එම වාර ගණන වැඩි කිරීම සඳහා රජය කටයුතු කිරීමට අදහසක් තිබේද;

(iii) එසේ නම්, ඒ කී වරක් දක්වාද;

(iv) එසේ වාර ගණන වැඩි නොකරන්නේ නම්, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට රජය අදහස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0377/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවැත්වූ අයිෆා සිනමා සම්මාන උළෙලේ සංවිධායක වරයාගේ නම් කුමක්ද;

(ii) ඒ සඳහා ඉල්ලුම් කළ අනෙකුත් රටවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාව සහ අයිෆා අතර අත්සන් කළ ගිවිසුම කවරේද;

(iv) එම ගිවිසුම අත්සන් කළ පුද්ගලයන්ගේ නම් කවරේද;

(v) අයිෆා සම්මාන උළෙල නිසා ශ්‍රී ලංකාවට දැරීමට සිදුවූ සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයිෆා සම්මාන උළෙලේ ප්‍රවේශ පත්‍රවල විකිණුම් මිල කොපමණද;

(ii) මේ සඳහා නිකුත් කරනු ලැබූ රුපියල් මිලියනයක වටිනාකම ඇති විශේෂ අනුග්‍රහ ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබූ පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ෂා රුක් ඛාන්, අමිතාභ් බච්චන් (වෙළෙඳ නාම තානාපති) සහ අයිශ්වර්යා රායි වැනි ප්‍රසිද්ධ නළු නිළියන් ශ්‍රී ලංකාවට පැමිණ මෙම උත්සවයට සහභාගී නොවීමට හේතුව කවරේද;

(ii) මෙම ප්‍රසිද්ධ නළු නිළියන් නොපැමිණීම නිසා 2010 ජූනි 03 වැනි දිනි වනවිට අවලංගු කරන ලද හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0417/'10

3.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්, වොක්ෂෝල් වීදියේ, අංක 175 හි පිහිටි වර්ග අඩි 5000 කින් යුත් ගබඩාව, කොළඹ 10, ටී. බී. ජයා මාවතේ අංක 338 හි පිහිටි ඇරිනා ඉන්ටර්නැෂනල් සමාගමට මාසික කුළිය රු. 108,000/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ඔප්පුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය හා රජයේ තක්සේරු වාර්තාව ලබාගෙන තිබේද;

(ii) බදුකරු විසින් බදු ගිවිසුමට අනුව හා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද; නැතහොත් කටයුතු කරගෙන යන්නේද;

(iii) එසේ නොමැති නම්, අදාළ ගබඩාව නැවත ජ.න.ව.ස.ම. ට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) නීත්‍යානුකූලව කටයුතුකර නොමැතිනම්, ඒ පිළිබඳව වගකිවයුත්තෝ කවුරුන්ද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0516/'10

4.

ගරු රෝසි සේනානායක මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාව තුළ දිනකට නිෂ්පාදනය කෙරෙන එළකිරි ප්‍රමාණය; ගොවීන්ගෙන් කිරි එකතු කරන මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ කිරි ලීටරයක් සඳහා ගොවීන්ට ගෙවන මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දේශීය එළකිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0610/'10

5.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂය අවසානය වන විට බන්ධනාගාරගත මව්වරුන් සමග සිටි දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) මව හා දරුවා යන දෙදෙනාම රැඳවියන් ලෙස බන්ධනාගාරගත වීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009 වර්ෂය අවසාන වන විට වයස අවු. 22ට අඩු බන්ධනාගාරගත සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරුණ වැරදිකරුවන් සාමාන්‍ය සිරකරුවන්ගෙන් වෙන්කර තැබීම සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0327/'10

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2008 සහ 2009 වර්ෂයන් තුළ, ශ්‍රී ලංකා රේගුව මගින් අත්අඩංගුවට ගන්නා ලද නීත්‍යානුකූල නොවන බඩු භාණ්ඩ වෙනුවෙන් අදාළ නිලධාරීන් වෙත ලබාදී ඇති ත්‍යාග සහ දීමනාවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(ii) එම ත්‍යාග සහ දීමනා ලබා ගත් නිලධාරීන් කවුරුන්ද;

(iii) අදාළ නිලධාරීන් වෙත ත්‍යාග සහ දීමනා ලබාදීමට හේතු වූ සිද්ධීන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිලධාරීන් වෙත ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0418/'10

7.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වොක්ෂෝල් වීදියේ, අංක 175 ඒ කොටසෙහි පිහිටි වර්ග අඩි 760 කින් යුත් ගබඩාව මඩුල්දෙණිය, බටගොල්ලවත්ත ලිපිනයේ පදිංචි ශාන්ත ජයසිංහ යන අයට මාසික කුළිය රු. 10,260/-ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) අදාළ බදුකරු විසින් බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) එසේ නොමැති නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) නීත්‍යානුකූලව ක්‍රියාකර නොමැති නම්, ඒ පිළිබඳව වගකිවයුත්තේ කවරහුද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0429/’10

8.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ක්‍රීඩා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන පිහිටුවා ඇති දිස්ත්‍රික්කවල නම් කවරේද;

(iii) එම ආයතනවල ප්‍රධාන තනතුරු දරන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) අනෙකුත් නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ උපන්දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නීතියෙන් ස්ථාපිත කර ඇති එබඳු ආයතන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එක් එක් ආයතනය සඳහා රජය මඟින් ප්‍රදානය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1973 අංක 25 දරන ක්‍රීඩා ආඥාපනත සහ 1993 අංක 47 දරන ක්‍රීඩා සංශෝධන පනත මගින් (අ)(i) හි සඳහන් ආයතනවල ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවට නියම කර තිබේද;

(ii) එබඳු ආයතනවල ගිණුම් සහ ක්‍රිකට් මණ්ඩලයේ මධ්‍යම ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

(iii) පසුගිය වර්ෂ 5 සඳහා ක්‍රිකට් මණ්ඩලයේ ගිණුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0517/’10

9.

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පෝෂණ ඌනතා ඇති දරුවන් සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ දැනට සිටින අවුරුදු 5ට අඩු මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සිටින මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දරුවන්ගේ පෝෂණය නැංවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන වැඩසටහන් කවරේද;

(ii) එම වැඩසටහන් යටතේ සිටින ප්‍රතිලාභීන් ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0611/'10

10.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂය අවසාන වන විට දඬුවම් නියම වූ සහ සැකකරුවන් වශයෙන් බන්ධනාගාරගත වී සිටි මුළු රැඳවියන් ගණන කොපමණද;

(ii) බන්ධනාගාර තුළ දැනට පවතින ඉඩ ප්‍රමාණවත් වන මුළු රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බන්ධනාගාර තුළ පවතින තදබදය අවම කිරීමට නව බන්ධනාගාර පිහිටුවීම සඳහා යෝජිත වැඩ පිළිවෙළක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0419/'10

11.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්, කොළඹ 10, ඩාර්ලි පාරේ, අංක 320 ස්ථානයේ පිහිටි වර්ග අඩි 12,845ක ගබඩාව, මහනුවර විලියම් ගොපල්ලව මාවතේ, මැග් කා කෙයාර් සෙන්ටර් සමාගම වෙත මාසික කුලිය රු. 199,418.63/-ක මුදලකට බදු දී ඇති බව, එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරු වාර්තාව හා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;

(ii) බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, නැවත අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) නීත්‍යානුකූලව බදු දී නොමැති නම්, ඒ පිළිබඳව වගකිවයුත්තෝ කවරහුද;

(iv) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0430/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක් එක් ආයතනය සඳහා අද වන විට ආයෝජනය කර ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සඳහන් කරමින්, රජයට අයත් සියලු ආයතනවල නම් කවරේද;

(ii) පසුගිය වසර තුනක කාලය තුළදී එකී ආයතනවල සේවය කළ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (අ) (i) හි සඳහන් ආයතනවල පසුගිය වර්ෂය සඳහා එක් එක් ආයතනයේ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ) (i) හි සඳහන් මුළු ආයතන සංඛ්‍යාවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා නොකරන සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වාර්තා නොකිරීමට හේතුව කවරේද;

(iii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය උල්ලංඝනය කිරීමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0484/'10

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) පුත්තලම සිට මන්නාරම දක්වා ප්‍රදේශයේ සුළං බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් සකස්කොට තිබේද;

(ii) එසේ නම්, ඇස්තමේන්තු අනුව එම ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල කොපමණද;

(iii) එයින් ජනනය කිරීමට අපේක්ෂිත විදුලිය ප්‍රමාණය මෙගාවොට් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ඉල්ලුම්කරුවන් කිසිවකු සිටින්නේද;

(ii) එසේ නම්, එම ආයතන හා ඒවා අයත් රටවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0518/'10

14.

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගැබිනි මව්වරුන් සහ කිරි දෙන මව්වරු අතරින් යකඩ ඌනතාවයෙන් පෙළෙන සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ පෝෂණය නැංවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අඩු බර දරු උපත් සංඛ්‍යාව කොපමණද;

(iv) අවුරුදු 5ට අඩු දරුවන් අතරින් යකඩ ඌනතාවයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උතුරු නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් ඉහත (අ) (i), (ii) සහ (iv) ට අදාළ සංඛ්‍යා ලේඛන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0612/'10

15.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අපරාධ නිසා බන්ධනාගාරගතවූවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එය එම වසර තුළ බන්ධනාගාරගත වූ මුළු සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අපරාධ නිසා සිරගතවූවන් සඳහා වෙනම බන්ධනාගාර පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම

1.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා,— මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන),— ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්වල හෝ ජන කැළඹීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන්ගේ ද, ජාතික මට්ටමේ බරපතල ප්‍රතිවිපාක සහිත ස්වාභාවික ව්‍යසනයක් හෝ විපත්තියක් මරණයට හේතුව වශයෙන් සෘජුව ම ආරෝපණය කළ හැකි තැනැත්තන්ගේ ද, මරණ ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

2.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන),— මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන),— පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේ දී මෙම පාර්ලිමේන්තුව 2010 නොවැම්බර් මස 09 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ ආඥාව,— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1) වැනි වගන්තිය යටතේ ඉඩම්, ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 1981 අප්‍රේල් මස 16 දිනැති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද ආඥාව අනුමත කළ යුතු ය.

*2.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 1),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1) වැනි වගන්තිය යටතේ මහවැලි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2000 මැයි මස 04 දිනැති අංක 1130/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*3.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 2),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2007 මාර්තු මස 06 දිනැති, අංක 1487/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*4.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියමය (අංක 3),— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදනු ලදුව, 2007 මාර්තු මස 09 දිනැති, අංක 1487/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*5.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 “පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*10.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*12.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**